සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

**සැලකිය යුතුයි:**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- I හා II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

---

- **පහත සඳහන් වාක්‍යවල ඉරිඇඳි පදවලට වඩාත් සමීප අර්ථ දෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) රූකඩ කපන්නා හකුරු <u>ඇබිත්තක්</u> සමග කෝපි කෝප්පයක් පානය කළේ ය.
(1) දිග කැබැල්ලක් (2) කුඩා ප්‍රමාණයක්
(3) විශාල ප්‍රමාණයක් (4) සම්පූර්ණ කොටසක්

(02) ''ඔබ <u>හුදකලා ව</u> සිටින්නේ මන්ද'' යි කාන්තාව ප්‍රශ්න කළා ය.
(1) කාර්යබහුල වී (2) යහළුවන් සමග
(3) තනිවම (4) කෝපයෙන්

- **සිංහල අක්ෂර මාලාව ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

(03) සිංහල අක්ෂර මාලාවේ පිල්ලමකින් සංකේතවත් නොවන ස්වරය වන්නේ,
(1) ආ (2) ඉ (3) උ (4) අ

(04) සිංහල අක්ෂර මාලාවේ ස්වර අක්ෂර ගණන
(1) 18කි. (2) 20කි. (3) 32කි. (4) 60කි.

- **පහත සඳහන් පද අතර උක්ත පද පමණක් අයත් පිළිතුර තෝරන්න.**

(05) (1) අපි , මා , ඔබ (2) ළමයා , ඔවුන් , නුඹ
(3) මම , ළමයි , කවීහු (4) කුරුල්ලා , අප , නුඹලා

- **නාම විශේෂණ පදයක් හා ක්‍රියා විශේෂණ පදයක් ඇතුළත් වාක්‍යය තෝරා යටින් ඉරක් අඳින්න.**

(06) (1) උපාසිකාවෝ සුදු පැහැ ඇඳුම් ඇඳිති.
(2) නරියා බෙහෙවින් සතුටු විය.
(3) 'හොඳ පොතක් කියවන්න'
(4) කුඩා දරුවා සතුටින් සිනාසෙයි.

Department of Education – Western Province

- **පහත සඳහන් පදයට සමානාර්ථ දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

(07) දිනිඳු :
(1) දුප්පත් (2) සූර්යයා (3) රජතුමා (4) අලංකාර

- **පහත සඳහන් පදයට විරුද්ධාර්ථ දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

(08) ග්‍රීෂ්මය :
(1) සිසිලස (2) දාහය (3) මධ්‍යාහ්නය (4) පවස

- **පහත සඳහන් වචන අතරින් නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

(09) (1) ඖෂධ (2) යහළුවෝ (3) ගිරි සිකර (4) පාඨශාලාව

- **පහත සඳහන් වගන්තියේ යොදා ඇති විරාම ලක්ෂණ නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.**

(10) ''ඔන්න බොලේ අද අහසින් වැටුණ මසක්''
(1) යුගල උඩු කොමා (2) විස්මයාදී ලකුණ
(3) ප්‍රශ්නාර්ථ ලකුණ (4) තනි උඩු කොමා

- **පහත සඳහන් වාක්‍යයෙහි ඉරි ඇඳි පදවල අර්ථ නිවැරදි ව දැක්වෙන පද වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

<u>නුවණ</u> මෙහෙයවා කටයුතු කරන්නන් තම <u>නුවන්</u> ගැන ද කල්පනාකාරී විය යුතුයි.

(11) නුවණ
(1) හිස (2) ඇස (3) ඥානය (4) ධනය

(12) නුවන්
(1) නැණ (2) ඇස් (3) පිහිට (4) කාලය

- **සඤ්ඤක අකුරක් යෙදී ඇති වචනය තෝරන්න.**

(13) (1) අභ්‍යාසය (2) උච්චාරණය (3) අර්ථය (4) කඹය

- **පහත දැක්වෙන නාමපද අතරින් මධ්‍යම පුරුෂ නාම පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.**

(14) (1) මම (2) නුඹ (3) ඔවුහු (4) ඇතා

- **අතීත කාල ක්‍රියාපදයක් ඇතුළත් පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(15) (1) ගියෝ ය. (2) විදිමි (3) හදාරති (4) නටමු

Department of Education – Western Province

- **පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

(16) (වැඩිහිටියෝ / වැඩිහිටියන්) ................................ අපට නිවැරදි මඟ පෙන්වති.

(17) (කවියා / කවියෝ) ................................ රසවත් කවි නිර්මාණය කළේ ය.

(18) (රෝගියා / රෝගීහු) ................................ සුවය ලබමින් සිටිති.

(19) ගුරුවරයා දරුවන් යහමග ................................ (යවයි / යැවූහ)

(20) සියලු කඳු පරිසරය අලංකාර ................................ (කළහ / කරයි) (ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **01 හා 02 ප්‍රශ්න අනිවාර්ය වේ. 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) ප්‍රස්තාව පිරුළු වලට අදාළ කතන්දර එක් කරමින් ඔබ විසින් පන්ති කාමරයේ දී කරන ලද නිර්මාණ සංග්‍රහය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) එම නිර්මාණ සංග්‍රහයට ඔබ යෙදූ නම කුමක් ද? (ලකුණු 02)

(2) එම නිර්මාණ සංග්‍රහය නිම කිරීමේ දී ඔබට පැවරුණු කාර්යය කුමක් ද? (ලකුණු 02)

(3) ඔබගේ එම නිර්මාණ සංග්‍රහයෙන් පන්තියේ අනෙකුත් සිසුන්ට ලැබුණු ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

(4) එම නිර්මාණ සංග්‍රහයට තොරතුරු රැස් කරගත් මූලාශ්‍ර **දෙකක්** ලියන්න. (ලකුණු 02)

(5) එය සකස් කිරීමේ දී ඔබ සැලකිලිමත් වූ කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 04)

(6) මෙවැනි නිර්මාණ එකතුවක් සකස් කිරීම නිසා ඔබ ලබාගත් ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16)

Department of Education Western Province

(02) පහත සඳහන් මාතෘකාවලින් **එකක්** තෝරාගෙන වචන 125කට නොඅඩු රචනයක් ලියන්න.

(1) රස ගුණ පිරි දේශීය ආහාර

(2) ජන කවියයි ගැමි දිවියයි

(3) මා වඩාත් ම කැමති ගත් කතුවරයා

(4) දුසිරිත් දුරලමු සුසිරිත් වඩමු

(5) ළමාවියේ දී මා ලැබූ සුන්දර අත්දැකීමක් (ලකුණු 14)

(03) ශ්‍රී ලංකාවේ සුන්දර ස්ථාන පිළිබඳ ව විස්තර කරමින් විදේශ රටක සිටින මිතුරියකට / මිතුරෙකුට ලිපියක් ලියන්න. (ලකුණු 10)

(04) පහත දැක්වෙන පද්‍යය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දත් කැකුළු පෑ ලා
සුරතල් සිනා සී ලා
බොළඳ බස් දී ලා
.............................................

(1) මෙම පද්‍යයේ අවසාන පද්‍ය පාදය ලියන්න.

(2) පද්‍යය උපුටාගත් ග්‍රන්ථය නම් කරන්න.

(3) එම ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න.

(4) එය ලියැවුණු සාහිත්‍ය යුගය ලියන්න.

(5) එයට පාදක වූ ජාතක කතාව කුමක් ද? (ලකුණු 2 × 5 = 10)

(05) පහත දැක්වෙන පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බලා සිටිද්දී රුපියල් දීලා එවෙලෙ ම කොළඹට යනවා ලූ
ගොන් බැන්දෙත් නැත අසු බැන්දෙත් නැත කරත්ත හතළිහ යනවා ලූ
කඩුගන්නාවේ බර පටවාලා පේරාදෙණියෙ නවතනවා ලූ
සිංහල සෙනඟට නුදුටු පුදුමයක් විෂ්ණු සමන් දෙවි මැව්වා ලූ

දර පටවනවා අඟුරු දමනවා ජල උණු වෙනවා නිරන්ත රේ
රැල නවතිනවා දුම තද වෙනවා විදුලි කොටනවා රේලු සැ රේ
මොර හඬ දෙනවා කම්පා වෙනවා පොළොව නටනවා රේලු සැ රේ
උඩහට එනවා පහළට යනවා බලන්ට එනවා රේලු සැ රේ

(1) මෙම පද්‍ය පන්තියෙන් කියවෙන්නේ කුමක් ගැන ද?

(2) මෙය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ද්‍රව්‍යයන් දෙකක් ලියන්න.

(3) මෙහි සඳහන් වන නගර දෙකක නම් ලියන්න.

(4) පහත දැක්වෙන පදවලට පද්‍ය පන්තියෙහි යෙදී ඇති පද තෝරා ලියන්න.

(අ) ගැල්

(ආ) මිහිකත

(5) මෙම පද්‍ය පන්තිය කියවන විට ඔබට ඇතිවන හැඟීම පේළි දෙකකින් පමණ විස්තර කරන්න. (ලකුණු 2 × 5 = 10)

Department of Education - Western Province

(06) පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කියන ලද්දේ දැ'යි ලියන්න. පාඩමේ නම ද ලියන්න.

| | ප්‍රකාශය | කවුරුන් විසින් ද? | පාඩමේ නම |
|---|---|---|---|
| 1. | ''ඔය ඇත්තන්ගේ උගත් මොළේට වැටහෙන්ට බැරිකමක් නෑ මේ අසරණයාට උපකාරයක් කරන හැටියක්'' | | |
| 2. | ''යහළුවා ඔහුගේ තැනෙහි දී මැ සුදුසු පරිදි දකිමැ'' | | |
| 3. | ''මා ඔත්තුකාරයෙක් හෝ බොරුකාරයෙක් නොවෙමි'' | | |
| 4. | ''නුඹ වහන්සේ එනතෙක් බලා උනුම්හ'' | | |
| 5. | ''මෙන්න මේ වගේ තමයි රචනා ලියන්න ඕනෑ'' | | |

(ලකුණු 2 × 5 = 10)

(07) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලෝක ප්‍රසිද්ධ මහා විද්‍යාඥයෙකු වූ අයිසෙක් නිව්ටන් ළමා වියේ සිට ම චිත්‍ර ඇඳීමට සමතෙක් විය. ඔහුගේ කාලයෙන් වැඩි කොටසක් මිඩංගු කළේ සරල උපකරණ තැනීමට හා නොයෙකුත් අත්හදා බැලීම් කිරීමට ය. ඔහුගේ දක්ෂකම් දිනෙන් දින ම දියුණු වූ නිසා ම ඔහුට වයස අවුරුදු දහඅට වන විට ම කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයට ඇතුළු වීමේ වරම් ලැබිණි. පසුව එහි දී ඔහු ශාස්ත්‍රසූරී උපාධිය ද ලබාගත්තේ ය. ගුරුත්වාකර්ෂණය පිළිබඳ න්‍යාය සොයා ගැනීමෙන් පසු ව ද අයිසෙක් නිව්ටන් දිගින් දිගට ම පර්යේෂණ කටයුතු කරගෙන ගියේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සූර්යයාගේ වර්ණාවලිය සම්බන්ධ න්‍යාය ඔහු විසින් සොයාගනු ලැබුවේ ය. තම සොයා ගැනීම් සඳහා 1703 දී ලන්ඩනයේ ආසියාතික සංගමයේ සභාපති ධූරය ද ඔහුට හිමි විය. විශ්වයේ අරුම පුදුම දේ ගවේෂණය කරමින් ලෝකයට අමිල සේවාවක් කළ මේ මහා විද්‍යාඥයා 1727 දී සදහට ම දෙනෙත් පියා ගත්ත ද ඔහු කළ සේවය අමරණීය වේ.

(1) අයිසෙක් නිව්ටන් තම කාලය වැඩිපුර යෙදවූයේ කුමක් සඳහා ද?
(2) ඔහු විසින් සොයාගත් අපූරු න්‍යායන් දෙකක් නම් කරන්න.
(3) විද්‍යා සොයාගැනීම්වලට අමතරව අයිසෙක් නිව්ටන් දක්ෂකම් දැක්වූයේ කුමක් සඳහා ද?
(4) දහඅටවන වියේ දී ඔහුට පිළිගත් විශ්ව විද්‍යාලයකට යාමේ අවස්ථාව උදාවූයේ කෙසේ ද?
(5) ''පොළොවට ඇද ගැනීම'' යන යෙදුම සඳහා ඡේදයේ සඳහන් තනිපදයක් සොයා ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

Department of Education – Western Province